# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2021 ජූලි මස 02 වන දින

## II වන කොටස

## අතිරේකය

(2021.07.05 දින නිකුත් කරන ලදී)


# මිල්කෝ කිරි නිෂ්පාදකයන්ගේ පදනම (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

## මිල්කෝ කිරි නිෂ්පාදකයන්ගේ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සමන්ප්‍රිය හේරත් මහතා විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 23.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## මිල්කෝ කිරි නිෂ්පාදකයන්ගේ පදනම (සංස්ථාගත කිරීමේ)

## මිල්කෝ කිරි නිෂ්පාදකයන්ගේ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

‘‘මිල්කෝ කිරි නිෂ්පාදකයන්ගේ පදනම’’ යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව, එකී පදනම සම්බන්ධ සියලු කාරණා එලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එකී පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩදීම යෝග්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2021 අංක     දරන මිල්කෝ කිරි නිෂ්පාදකයන්ගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මිල්කෝ කිරි නිෂ්පාදකයන්ගේ පදනම සංස්ථාගත කිරීම

**2.** (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට සහ ඉන් පසු (මෙහි මින්මතු ‘‘පදනම’’ යනුවෙන් සඳහන් කරනු ලබන) මිල්කෝ කිරි නිෂ්පාදකයන්ගේ පදනම දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් ද, ‘‘මිල්කෝ කිරි නිෂ්පාදකයන්ගේ පදනම’’ යන නාමය හා අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින්මතු ‘‘සංස්ථාපිත මණ්ඩලය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාපිත මණ්ඩලයක් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාපිත මණ්ඩලය විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාපිත මණ්ඩලයට ඇත්තේ ය.

(2) සංස්ථාපිත මණ්ඩලය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ස්වේච්ඡා සමාජ සේවා ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන,

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

**3.** සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) කිරි නිෂ්පාදනය සාර්ථක ආර්ථික ව්‍යවසායයක් ලෙස සංවර්ධනය කිරීම සහ එමඟින් පදනමේ සාමාජිකයන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම;

(ආ) පදනමේ සාමාජිකයන්ගේ ප්‍රතිලාභය සඳහා මිල්කෝ පුද්ගලික සමාගම සමග සහයෝගීව කටයුතු කිරීම;

(ඇ) දේශීය කිරි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සාමාජිකයන්ගේ සහභාගිත්වය මගින් ප්‍රතිලාභ ලබා ගැනීමට අවශ්‍ය වන්නා වූ සාමාජිකත්ව ව්‍යුහයක් සැකසීම;

(ඈ) පිරිසිදු හා ප්‍රමිතියෙන් උසස් කිරි නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම;

(ඉ) ආර්ථික වශයෙන් සාර්ථක සහ ඵලදායී කිරි නිෂ්පාදනයක් තහවුරු කිරීම සඳහා සාමාජිකයන්ට අවශ්‍ය උපදෙස් සහ සහාය ලබා දීම; සහ

(ඊ) කිරි අලෙවි කිරීම සඳහා මිල්කෝ පුද්ගලික සමාගම මගින් අවශ්‍ය පහසුකම් සැලසීම.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක වැඩ සමග ගැටීමක් ඇති නොවීමට සංස්ථාපිත මණ්ඩලය සහතික විය යුතු බව.

**4.** සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු, සංස්ථාවේ වැඩ සහ ඒ හා සමගාමීව ආණ්ඩුවේ හෝ යම් පළාත් සභාවක, අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් මගින් කරගෙන යන යම් වැඩ අතර ගැටීමක් උද්ගත නොවන ආකාරයට කරගෙන යා යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම මේ පනතේ විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, සහ ඒ යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන හෝ පත් කර ගනු ලබන සභාපතිවරයා හා ලේකම්වරයා ඇතුළු තවත් සාමාජිකයන් යම් සංඛ්‍යාවකින් සමන්විත වූ සභාවක් මගින් පාලනය විය යුතු ය.

(2) (අ) මේ පනත ආරම්භවන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සභාව, (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව අලුත් සභාවක් තෝරා පත් කරගනු හෝ පත් කරගනු ලබන තෙක්, සංස්ථාපිත මණ්ඩලයේ අතුරු සභාව ලෙස කටයුතු කළ යුතු ය.

(ආ) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරිපාලනය සම්බන්ධයෙන් සහ සංස්ථාපිත මණ්ඩලයේ පළමු සභාවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම හෝ පත්කර ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදාගැනීම සඳහා අතුරු සභාවට බලය ඇත්තේ ය.

(ඇ) අතුරු සභාවේ යම් තීරණයක්, එහි යම් රැස්වීමක් සඳහා පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරය විසින් ගනු ලැබිය යුතු ය.

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම සභාව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ සිට අවුරුද්දක් ඇතුළත පත් කර ගැනීම හෝ තෝරා පත් කර ගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකයන් සහ උපදේශකයන් සිටී නම්, ඔවුන් ද ඇතුළුව, සභාවේ සෑම ධුර දරන්නකුම අවුරුදු තුනක කාලයක් සඳහා පත් කර ගැනීම හෝ තෝරා පත් කර ගැනීම කළ යුතු අතර, අනුශාසකයන් සහ උපදේශකයන් සිටී නම් ඔවුන් ද ඇතුළුව, සෑම ධුර දරන්නෙකුම එම අවුරුද්දක කාලසීමාව ඉකුත් වූ පසු නැවත පත් කර ගැනීමට හෝ තෝරා පත් කර ගනු ලැබීමට හිමිකම් ලබන්නේ ය.

(ආ) යම් ධුර දරන්නකු මිය යාම, ඉල්ලා අස්වීම, නොහැකියාව හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් පුරප්පාඩුවක් ඇති වන

අවස්ථාවක සභාව විසින්, සංස්ථාපිත මණ්ඩලයේ රීති සැළකිල්ලට ගනිමින් එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තු පත් කිරීම හෝ තෝරා පත් කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ පත් කර ගනු ලැබූ හෝ තෝරා පත් කරගනු ලැබූ තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා ධූර දරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**6.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයට පහත සඳහන් බලතල ඇත්තේ ය:—

(අ) මිල්කෝ පුද්ගලික සමාගමේ සභාපතිවරයාගේ අනුමතය ඇතිව, සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු උදෙසා ඉඩම් හෝ ගොඩනැගිලි මිළ දී ගැනීම, ඉදි කිරීම, අලුත්වැඩියා කිරීම, කුලියට දීම හෝ අන්‍යාකාරයෙන් ඒවා ලබාගැනීම සහ මණ්ඩලයේ අරමුණු ප්‍රවර්ධනය කිරීමේ අදහසින් සුදුසු යයි සලකනු ලැබිය හැකි ආකාරයට ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ සාක්ෂාත් කර ගැනීම හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි වූ සියලු ගිවිසුම් හෝ කොන්ත්‍රාත්වලට ඍජුව හෝ තත්කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් බලය පවරනු ලැබූ නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් ඇතුළු වී ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාවේ යෙදවීම;

(ඇ) ඇප ඇතිව හෝ නැතිව, අරමුදල් ලබා ගැනීම හෝ එකතු කිරීම සහ මුදලින් ද්‍රව්‍යමය වශයෙන් දීමනා, ත්‍යාග හෝ පරිත්‍යාග පිළිගැනීම:

එසේ වුව ද, විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන්, සභාව විසින්, මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ඒ සඳහා ලබා ගත යුතු ය;

(ඇ) මේ පනතේ කාර්යය සඳහා, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රදේශ තුළ, ක්‍රියාකාරී කමිටු සහ ගොවි සංගම් පිහිටුවීම සහ පවත්වාගෙන යෑම;

(ඉ) ගණුදෙනු කළ හැකි සාධනපත්‍ර, චෙක්පත්, පොරොන්දු පත්‍ර සහ අනෙකුත් ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීම, පිළිගැනීම, වට්ටම් කිරීම, පිටසන් කිරීම, අලෙවි කිරීම සහ ගණුදෙනු කිරීම, නිකුත් කිරීම සහ විධායක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ යම් බැංකුවක හෝ බැංකුවල ගිණුම් විවෘත කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම සහ වසා දැමීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු සඳහා වහා අවශ්‍ය නොවන යම් අරමුදල් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට ආයෝජනය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යම් නීත්‍යානුකූල භාර හෝ යම් නිශ්චල දේපළ හෝ පුද්ගලික දේපළ පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය කිරීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන් සේවයේ යෙදවීම, සේවයෙන් පහකිරීම හෝ සේවය අවසාන කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුනට සංස්ථාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් වැටුප්, දීමනා හෝ පාරිතෝෂික ගෙවීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ අරමුණුවලට සමාන අරමුණු ඇති දේශීය හෝ විදේශීය ආයතන සමඟ සම්බන්ධීකරණය;

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු සඳහා නිලධරයන් සහ සේවකයන් පුහුණු කිරීම; සහ

(ඔ) සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු කරා එළඹීමට අවශ්‍ය සහ යෝග්‍ය වන්නා වූ සියලු නීත්‍යානුකූල දේවල් කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සඳහා, කලින් කල, සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉවත් කිරීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ නෙරපීම සහ ඔවුන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) සභාවේ, සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, ඔවුන් විසින් ධුරය හිස් කිරීම හෝ ඔවුන්ව ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්යය, කර්තව්‍ය සහ පාරිශ්‍රමික;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන් සහ සේවකයන්ගේ පත්වීමේ නියම සහ කොන්දේසි, බලතල. කර්තව්‍ය, කාර්ය සහ පාරිශ්‍රමික;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ සහ සභාවේ රැස්වීම කැඳවීම සහ රැස්වීම් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, ඒ රැස්වීම් සම්බන්ධ දැන්වීම්, න්‍යාය පත්‍රය සහ ඒ සඳහා ගණපූරණ සහ ඒවායෙහි කටයුතු පවත්වාගෙන යාම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ සහ සභාවේ සාමාජිකයයන් වීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය කිරීම;

(උ) සභාව විසින් පිහිටුවනු ලබන ක්‍රියාකාරී කමිටු සහ ගොවි සංගම්වල බලතල, කාර්ය, කර්තව්‍ය සහ ඒ හා සම්බන්ධිත වෙනත් යම් කාරණා; සහ

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ සාමාන්‍ය කටයුතු කළමනාකරණය කිරීම, එහි අරමුණු සාක්ෂාත් කරගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදනු ලබන සෑම රීතියක්ම (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන්ම, එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයට සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලබන රීති, ඒ රීති සෑදීමෙන් මාස තුනක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එතැන් පටන් බලාත්මක වන්නේ ය.

(4) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සාමාජික නාමලේඛනය

**8.** සභාව විසින් සාමාජිකයන්ගේ නම, ලිපිනය සහ ඔවුන්ගේ අනෙකුත් අත්‍යවශ්‍ය විස්තර ඇතුළත් කරනු ලබන්නා වූ නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**9.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් සංස්ථාපිත මණ්ඩලයට ලැබෙන සියලු මුදල් (මෙහි මින්මතු “අරමුදල” යනුවෙන් සඳහන් කරනු ලබන) 6 (ඇ) වගන්තියේ විධිවිධානවලට යටත්ව සංස්ථාපිත මණ්ඩලයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, එම අරමුදල විධායක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක හෝ බැංකුවල පවත්වාගෙන යා යුතු ය.

(3) මිල්කෝ කිරි ගොවි සමාජ ආරක්ෂණ අරමුදලේ බැරට පවතින සියලු මුදල් ප්‍රමාණයන්, මෙම පනත ක්‍රියාත්මක වන දින සිට, සංස්ථාපිත මණ්ඩලයට බැර කරනු ලැබිය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී එය විසින් දරනු ලබන සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම් සහ වියදම්, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ ව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව විගණකාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු අතර, ඒවා විගණකාධිපතිවරයා හෝ එම සුදුසුකම්ලත් විගණකවරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් -

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ තැනැත්තෙක්; හෝ

(ඇ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තීයෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි ගණකාධිකාරි සමාගමක්, හෝ

අදහස් වේ.

වාර්ෂික වාර්තාව

**11.** (1) සභාව විසින් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්ථාවක් සෑම මුදල් වර්ෂයක් ම සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව 10 වන වගන්තියේ දක්වා ඇති විගණකාධිපතිවරයා හෝ සුදුසුකම්ලත් විගණකවරයා විසින් සහතිකකරන ලද විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග ඒ වාර්තාව, අදාළ වන වසරට පසුව එන වර්ෂයේ හය මාසයක් ඉකුත් වීමට පෙර සමාජ සේවා විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාපිත මණ්ඩලය වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙන ම ගිණුම් ප්‍රකාශයක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග යැවිය යුතු ය.

*පදනමට අයවිය යුතු සහ පදනමෙන් ගෙවිය යුතු ණය*

**12.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනම විසින් ගෙවිය යුතු සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අය විය යුතු සියලු ණය සහ පදනමෙන් ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලයට ගෙවනු ලැබිය යුතු ය.

*සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව*

**13.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් යම් චංචල සහ නිශ්චල දේපළ අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාපිත මණ්ඩලයට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එම සියලු දේපළ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව සංස්ථාවේ කාර්යය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

*මුදල් සහ දේපළ අදාළ කර ගැනීම*

**14.** සංස්ථාපිත මණ්ඩලයේ මුදල් හා දේපළ, මෙහි දක්වා ඇති සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එහි කිසිම කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් වෙත ඍජුවම හෝ වක්‍රව ලාභාංශ, ප්‍රසාද, දීමනා, ලාභ හෝ වෙනත් යම් ආකාරයකින් ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

*සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව*

**15.** (1) තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් යම් සාධනපත්‍රයක තම නම් අත්සන් කළ යුතු සභාපති සහ ලේකම් ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, සභාව විසින් නිශ්චය කරනු ලබන යම් නිලධරයකුගේ භාරයේ තිබිය යුතු ය.

**සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ**

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසිරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වුවහොත්, එම දේපළ එහි සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායම් හෝ දේපළ ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් එවැනි ආයතනයකට එම දේපළ දීම හෝ පැවරීම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා උචිත ආයතනය සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුව ම කැඳවනු ලබන මහා සභා රැස්වීමක දී ඊට පැමිණ සිටන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම**

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ යම් සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

**18.** මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.